# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,956 - 2016 පෙබරවාරි මස 26 වැනි සිකුරාදා - 2016.02.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු ඇබෑර්තු .... ... ... | 308 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. **නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි ගැසට් පත්‍රය පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.**

ගැසට් පත්‍රයේ පළ කරන සෑම දැන්වීමක් ම ගැසට් පත්‍රය පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 මාර්තු මස 18 වැනි දින පළකරන ගැසට් පත්‍රයේ දැන්වීම් 2016 මාර්තු මස 01 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති (වැ. බ.)

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම ගැසට් පත්‍රය *www. documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින් ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතු ය. (1961 ජනවාරි මස 01 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයයෙහි මෙම නියමය අදාළ නොවන්නේ ය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලක දී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත්ව දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලු ම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑ ම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරිහු පූර්වෝක්ත 2 වැනි වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අතිකුත් කොන්දේසිවලට ද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලු ම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලු ම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේ දී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීණතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකි ය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාලසීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැලසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාලසීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකි ය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නා වූ ද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යැයි රජය විසින් නියම කරනු ලබන ප්‍රතිශතයක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේ ය. මුදල් වර්ෂය අවසානයේ දී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නා වූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නා වූ නිලධාරීන්හට පිළිවෙලින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබූ යුද, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාවක යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාලසීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව තිබුණ ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතු ය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේවා මුක්ත භටයින් ද, සහාය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයට ද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැඳී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම් ද, ඔවුන්ගේ එම සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම් ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 03 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනි දින දක්වා වූ කාලසීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නා වූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකි ද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතු ය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතු ය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුව ද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කලින් දැන ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින් ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේ ය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට, රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 වැනි දින සිට සිදුකරනු ඇත.

## විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියලුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලු ම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ගේ අභිමතය පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබිය හැකිය :-

- (i) මුළු විභාගයටම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට පෙනී සිටීම හෝ තහනම් කිරීම,
- (ii) විභාගයේ එක් විෂයයකට හෝ මුළු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම,
- (iii) එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (iv) මුළු ජීවිත කාලයේ ම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම,
- (v) සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම,
- (vi) විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වගකිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගාපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතු වේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේ ය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳ ව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේ ය.

1. සියලු ම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසලදීත් විභාග ශාලාධිපතීන්ට ද, ඔහුගේ සහකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාග ශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාග ශාලාධිපතීන්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය.

3. විභාගයේ දී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුළු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමා වී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාග ශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට සිදුවේ.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන් ම නිශ්ශබ්ද ව සිටිය යුතු ය. මොන ම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීමක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාග ශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතු යි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිවිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සලකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිවිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමක් ලෙස සැලකිය හැකි වේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතු ය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතු ය. එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේ දී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම් ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවල දී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමත් චිත්‍ර කර්මයේ දී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සලකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේ දී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැලකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපිද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොළ හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොතපතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාග ශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයෙක්ම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සලකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොතපතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොළයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන, හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම, හොර උත්තර ලිවීමට යත්න දැරීමද තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසිය යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකු ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකාරීත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේ දී පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයෙකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත්, කෙනෙකුගේ අනන්‍යතා සහතිකය වෙනස් කිරීමත් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයන් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සලකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතු ය. :—

(i) විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

(ii) යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාග ශාලාධිපතීන්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගු වී යාමට හේතු විය හැකිය.

(iii) විභාගයට පෙනී සිටීමේ දී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේ දී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාග ශාලාධිපතීන්හට දන්වා විභාගය අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

(iv) විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපිද්‍රව්‍ය (එනම් ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මෝස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේ දී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද්දේ නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

(v) විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රෙදි කෑලි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

(vi) තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේ දී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිවිය යුතුයි.

(vii) උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

(viii) අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

(ix) ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව ද සෑහෙන පමණ විශාලව ද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවල දී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවල දී ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

(x) එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරේ තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

(xi) ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතීන්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩි වී සිටිය යුතුය. එසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැති වී යාමට ද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සලකනු ලැබීමට ද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයෙකුට හෝ බාර නොදිය යුතුය.

(xii) යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විට ද, කඩදාසි ආදිය අවශ්‍ය වූ විට ද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

**විභාග කොමසාරිස් ජනරාල්.**

පැලවත්ත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කළුතර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 03 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කළුතර | බේරුවල | කළුතර, පානදුර හා තොටමුණ කොට්ඨාසයේ මරදන ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කළුතර |

02-662

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගම්පහ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 10 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගම්පහ | ජා ඇල | කඳාන කොට්ඨාසයේ උප්පැන්න මරණ හා දකුණු අළුත්කුරු කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගම්පහ. |

02-773

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — කුරුණෑගල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකිය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| කුරුණෑගල | බිංගිරිය | කුරුණෑගල දිස්ත්‍රික්, කටුගම්පල හත්පත්තුව කොට්ඨාසයේ කරදපත්තුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය. | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, කුරුණෑගල |

02-708

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — අම්පාර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවලට අදළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ මුස්ලිම් විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා මුස්ලිම් පුරුෂ පක්‍ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

03. ඉල්ලුම්කරුවන් වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60 ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති හා සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| අම්පාර | කල්මුණ | අම්පාර දිස්ත්‍රික්කයේ කරවාහුපත්තුව (කල්මුණකුඩි) කොට්ඨාසයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, අම්පාර |

02-711

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — නුවරඑළිය දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| නුවරඑළිය | හඟුරන්කෙත | නුවරඑළිය දිස්ත්‍රික්කයේ කොහොක කෝරළය කොට්ඨාසයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, නුවරඑළිය. |

02-709

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — රත්නපුර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

01. ඉල්ලුම්කරුවන් අදාළ උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය තුළ ස්ථිර පදිංචියක් ඇත්තා වූ හා සෑහෙන දේපළක් හිමි ප්‍රදේශවාසීන්ගේ සැළකිල්ල ලබන අය ද විය යුතු ය.

02. මෙම තනතුර සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකි ය.

03. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 30ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 60ට නොවැඩි විය යුතු ය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතු ය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාළ දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලින් බලාගත හැකි ය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් රෙජිස්ට්‍රාර් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැකි ය.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2016 මාර්තු මස 28 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යැවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 05 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/A3, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

#### උපලේඛනය

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| රත්නපුර | බලන්ගොඩ | බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය (දෙමළ මාධ්‍ය) | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, රත්නපුර. |

02-663

**විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් කැඳවීමේ දැන්වීම සංශෝධනය කිරීම**

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව — මහනුවර දිස්ත්‍රික්කය

2016.01.22 දින අංක 1951 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ *ගැසට්* පත්‍රයේ නිවේදනය කර තිබූ අයැදුම්පත් කැඳවීමේ දැන්වීමේ උපලේඛනයේ පහත දක්වා ඇති කොට්ඨාසය පමණක් පහත පරිදි සංශෝධනය විය යුතු බවත්, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය 2016.03.28 දින වන බවත් මෙයින් නිවේදනය කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙස ම බලපවත්වන බව ද කරුණාවෙන් සලකන්න.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| මහනුවර | අකුරණ | හාරිස්පත්තුව කොට්ඨාසයේ අලවතුගොඩ ප්‍රදේශයේ අතිරේක විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, මහනුවර |

02-712

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුර සඳහා අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය සංශෝධනය කිරීම**
**ගාල්ල දිස්ත්‍රික්කය**

අංක 1940 හා 2015.11.06 දිනැති *ගැසට්* පත්‍රයෙහි ම විසින් පළ කරන ලද දැන්වීමෙහි පහත සඳහන් උපලේඛනයේ දැක්වෙන විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2016.03.28 වැනි ද දක්වා දීර්ඝ කරමි.

02. එම අයදුම්පත් කැඳවීමේ දැන්වීමෙහි සඳහන් අනෙකුත් කරුණු සියල්ලම එලෙසම බලපවත්වන බවද කරුණාවෙන් සලකන්න.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2016 පෙබරවාරි මස 08 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3 රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් එවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| ගාල්ල | ගාල්ල කඩවත් සතර | ගාල්ල දිස්ත්‍රික් කොට්ඨාසයේ ගිංතොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල |

02-710

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීම, 2015**

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

*02. විභාගය :-*

2016 මැයි මාසයේ දී ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අනුකූලව සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

*03. සේවා කොන්දේසි :-*

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසි වලටද, මෙහි පහත සඳහන් කොන්දේසි වලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුරට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) විවෘත බඳවා ගැනීම් යටතේ පත්කරනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක පරීක්ෂණ කාල සීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීමද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත් අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

*04. වැටුප් පරිමාණය :*

MN-3-2006A තාක්ෂණ නිලධාරී III

රු. 15,005 - 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - රු. 17,165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ. III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-

අවම සීමාව : වයස අවුරුදු 18 ට නොඅඩු විය යුතුය.

උපරිම සීමාව : වයස අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :

*අධ්‍යාපන සුදුසුකම් :*

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය, විද්‍යාව සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථ සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම;

*සහ*

ව්‍යවහාරික ගණිතය, ශුද්ධ ගණිතය, රසායන විද්‍යාව, භෞතික විද්‍යාව, සංයුක්ත ගණිතය යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ ගණිතය විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය එකවර සමත් වීම.

*වෘත්තීය සුදුසුකම් :*

මොරටුව විශ්ව විද්‍යාලයේ හෝ අම්පාර හාඩි ආයතනය විසින් පිරිනමනු ලබන ජාතික ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව;

*හෝ*

අධ්‍යාපන හා උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන ජාතික උසස් ඉංජිනේරු (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය විසින් පිරිනමනු ලබන තාක්ෂණ ඩිප්ලෝමාව;

*හෝ*

ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය විසින් පවත්වනු ලබන ඉංජිනේරු විභාගයේ පළවන කොටස (සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා) සාර්ථකව සම්පූර්ණ කිරීම;

*හෝ*

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ලද ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණ සුදුසුකම් වලට සියළු අතින් සමාන යැයි ශ්‍රී ලංකා තාක්ෂණ සේවා මණ්ඩලය විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*කායික සුදුසුකම් :* මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

*වෙනත් සුදුසුකම් :*

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතුය.

(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.

(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය :*

සියළු බඳවා ගැනීම්, අදාළ චක්‍රලේඛ උපදෙස් අනුව හා ශ්‍රී ලංකා තාක්ෂණ සේවා ව්‍යවස්ථාවට අදාළව සිදු කෙරේ.

විවෘත තරග විභාගය සඳහා නියමිත සෑම ප්‍රශ්න පත්‍රයකටම 40% ක් හෝ ඊට වැඩි ලකුණු සංඛ්‍යාවක් ලබාගත් අපේක්ෂකයින් කුසලතා අනුපිළිවෙල මත සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු දීම සිදු නොකරන අතර, සුදුසුකම් තහවුරු කළ අයදුම්කරුවන් විභාගයේදී ලබාගත් මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල මත බඳවාගැනීම සිදුකරනු ලැබේ.

08. *විභාගය :* මෙම විභාගය ලිඛිත ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විතය.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 1. | බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. | පොදු පරීක්ෂණ (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

(i) මෙම විභාගය, සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.

(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැකි අතර, විභාගයේදී පෙනී සිටින සියළුම ප්‍රශ්න පත්‍ර වලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතුය.

(iii) ඉල්ලීම් කරන ලද භාෂා මාධ්‍ය විභාගයේදී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.

(iv) *විභාග ගාස්තුව රු. 400.00* :
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද ජේරාදෙණිය. තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් ලබාගත් මුදල් ඇනවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(v) *විෂය නිර්දේශය :*

(අ) *බුද්ධි පරීක්ෂණය* .- කාලය පැය 01 යි මුළු ලකුණු 100 යි අපේක්ෂකයාගේ සිතීමේ තාර්කානුකූලතාවක්, ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයන්, තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(ආ) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) : .- කාලය පැය 1යි. මුළු ලකුණු 100 යි. පහත දක්වෙන විෂයයන්ගෙන් සමන්විත ප්‍රශ්න පත්‍රයකි.

(i) මැනීම සහ මට්ටම් ගැනීම

දම්වැල් ගැනීම මට්ටම් ගැනීම

| | |
|---|---|
| නියොඩලයිට්ටුව භාවිතය පිළිබඳ දැනුම | තල මේස මැනුම් පිළිබඳ දැනුම |

(ii) ගොඩනැගිලි ද්‍රව්‍ය
සිමෙන්ති, හුණු වැලි, ගල්, තීන්ත වර්ග, වාර්නිෂ් වර්ග, ප්ලාස්ටික් සහ වීදුරු, ගොඩනැගිලි ද්‍රව්‍ය වශයෙන් යොදා ගනු ලබන හොඳ තත්වයේ ද්‍රව හඳුනා ගැනීමේ දැනුම

(iii) ගොඩනැගිලි ඉදි කිරීම හා ඇස්තමේන්තු පිළියෙල කිරීම

අත්තිවාරම්, බිත්ති බැඳීම, දව වහලය, යකඩ තාප්ප, කුළුණු, කොන්ක්‍රීට් තලාද සහ කොන්ක්‍රීට් කුළුණු/අත්තිවාරම්/තට්ටු/තරප්පු ආදිය යොදනු ලබන ආකාරය සහ යොදනු ලබන අවස්ථා

මිනුම් ලබා ගැනීම, ඇස්තමේන්තු පිළියෙල කිරීම, ඉදි කිරීම සඳහා අවශ්‍ය ගොඩනැගිලි ද්‍රව්‍ය ප්‍රමාණයන් සහ කම්කරුවන් සංඛ්‍යාව ඇස්තමේන්තු කිරීම

(iv) ව්‍යුහ නම්‍යතා/ව්‍යාපෘති බල සටහන

(v) සේවාවන් - විදුලි, ජල, සනීපාරක්ෂක

09. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :

ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනයට ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2016 මාර්තු 28 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ, වම්පස ඉහල කෙලවරේ'' තාක්ෂණ නිලධාරී III ශ්‍රේණියේ තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාග ය'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන :

(i) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයන්ගේ සම්පූර්ණ නම :———.
(ii) ලිපිනය :———.
(iii) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :———.

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන/වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

අපේක්ෂකයාගේ අනන්‍යතාවය :

විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛණ පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (විභාග දිනට අවුරුදු 3 කට කලින් නිකුත් කරන ලද)

සාවද්‍ය තොරතුරු සැපයීම :

මෙම විභාගයට ඉදිරිපත් වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කළ බව පෙනී ගිය හොත් ඔහු/ඇය සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට්* පත්‍රයේ 03 වන ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයන් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය, ඩී. ආර්. ටී. ජී. රත්නායක,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් *(වැ. බ.)*

2016 පෙබරවාරි 10 දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

සමාජ සේවා, සුබසාධන හා පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය

**සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ තාක්ෂණ නිලධාරි තනතුර සඳහා අයදුම්පත්‍රය

| | |
|---|---|
| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |

| |
|---|
| |

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න)

01.නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.

(උදා) Silva B. A.

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :———.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

02. ලිපිනය :

පෞද්ගලික :———.

රාජකාරී ලිපිනය :———.

ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :———.

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදළ කොටුව තුළ සළකුණු කරන්න)

3.1 ස්ත්‍රී

පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය : මාසය : දිනය :

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු : මාස : දින :

3.4 විවාහක අවිවාහක බව (අදාළ අංකය කොටුව තුළ සළකුණු කරන්න) :

විවාහක

අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය :

වර්ෂය :———. මාසය :———.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :———. මාසය :———.

| විෂය | ලබාගත් සාමාර්ථය | විභාග අංකය |
|---|---|---|
| | | |

4.3 (අ) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :———.

4.4 වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :———.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්) :

| තනතුර | ආයතනය | සිට | දක්වා |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :———.

මුදල් ඇණවුම් අංකය :———.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට<br><br>ගෙවන කාර්යාලය : පේරාදෙණිය |

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

**දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම දෙපාර්තමේන්තුවේ.......................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවරුදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :———.
ලිපිනය :———.
දිනය :———.

02-814

**ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීම - 2016**

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2016 මැයි මාසයේදී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවරදී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :-

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත් කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත් වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) බඳවා ගනු ලබන නිලධාරීන් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත් කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරීන් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියළුම නිලධාරීන් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීනතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීති වලට ද, ආයතන සංග්‍රහයේ විධි විධාන වලට ද, මුදල් රෙගුලාසි වලට ද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත්, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසි වලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :-

MN-3-2006A - පර්යේෂණ සහකාර තනතුරේ III ශ්‍රේණියේ
රු. 15,005- 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885
(රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - 17,165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

III ශ්‍රේණියේ නිලධාරීන් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් :-

අධ්‍යාපන සුදුසුකම් :

රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම ;

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

වෘත්තීය සුදුසුකම් :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෙ වුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම ;

හෝ

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

*සටහන* :
ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

*කායික සුදුසුකම්* :-
මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

*වෙනත්* :-
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය.
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරඟ විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :-

ලිඛිත තරඟ විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*ලිඛිත විභාගය* :-
මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු පරිමාණය* | *සමත් ලකුණු පරිමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය* :
(i) මෙම විභාගය සිංහල, දෙමළ, හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍යය විභාගයේදී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 400 කි
(v) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කර ගත හැකි වනසේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම්පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.

(vi) විෂය නිර්දේශය :

(*අ*) *බුද්ධි පරීක්ෂණය* :
අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයන් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්ත්වයන් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්න වලින් යුක්තය.

(*ආ*) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය)
(i) රසයනාගාර උපකරණ හඳුනාගැනීම හා නඩත්තුව,
(ii) රෝග විනිශ්චය සඳහා යොදා ගන්නා පරීක්ෂණ ක්‍රම, (ව්‍යාධි වේද, පරපෝෂිත වේද, ක්ෂුද්‍ර ජීව වේද, මස්තු වේද, පෝෂණ)
(iii) තත්ත්ව පාලනය සඳහා යොද ගන්නා පරීක්ෂණ ක්‍රම, (භෞතික පරීක්ෂණ, රසායනික පරීක්ෂණ, සංවේදතා පරීක්ෂණ)
(vi) රසායනාගාර පවිත්‍රතාව, විෂබීජහරණය,
(v) සාම්පල් ලබාගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය.

09. ඉල්ලුම් කිරීමේ ක්‍රමය :-
(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදාසියක දෙපැත්තම ප්‍රයෝජනය ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2016 මාර්තු 28 දිනට පෙර "අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය, යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහල කෙළවරේ ''පර්යේෂණ සහකාර තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන* :-
රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීම අත්‍යවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශපත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :
(ii) ලිපිනය :
(iii) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.
(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික.

*අපේක්ෂකයාගේ අනන්‍යතාවය* :-
විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේදී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛන පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය.
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය. (විභාග දිනට අවුරුදු 3 කට කලින් නිකුත් කරන ලද)

*සාවද්‍ය තොරතුරු සැපයීම* :-
මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දැන දැන ඉදිරිපත් කල බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේ ය.

මෙම *ගැසට් පත්‍රයේ* 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාල වන පොදුකොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේ ය.

12. මෙම *ගැසට්* නිවේදනයේ සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන්ද විභාගය මඟින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන්ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩී. ආර්. ටී. ජී. රත්නායක,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (*වැ.බ.*)

2016 පෙබරවාරි මස 10 වැනි දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය*

*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පර්යේෂණ සහකාර නිලධාරි තනතුර සඳහා අයදුම්පත**

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ කොටුව තුළ ලියන්න)

01.නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.
(උදා. SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :———.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය :

02. ලිපිනය :

පෞද්ගලික :———.
රාජකාරි ලිපිනය :———.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :

03. ස්ත්‍රී පුරුෂ භාවය (අදළ කොටුව තුළ සළකුණු කරන්න) :

3.1 ස්ත්‍රී
පුරුෂ

3.2 උපන් දිනය :

වර්ෂය මාසය දිනය

3.3 ඉල්ලුම්පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු මාස දින

3.4 විවාහක අවිවාහක බව (අදාල අංකය කොටුව තුළ සළකුණු කරන්න) :

විවාහක
අවිවාහක

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගය

වර්ෂය :———. මාසය :———.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :———. මාසය :———.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :———.

4.4 වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :———.

05. වර්තමාන රැකියාව හා කලින් දරූ පත්වීම් (ඇත්නම් පමණක්) :

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :———.

මුදල් ඇණවුම් අංකය :———.

| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය : පේරාදෙණිය කුවිතාන්සිය මෙහි අලවන්න. |
|---|

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාළ වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ.......................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත්, අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියා,
(නිල මුද්‍රාව තැබිය යුතු ය)

පදවි නාමය :———.
ලිපිනය :———.
දිනය :———.

02-810

### ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය

### සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීම - 2016

සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය සඳහා සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. *විභාගය* :

2016 මැයි මාසයේ දී සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් විසින් මහනුවර දී මෙම විභාගය පවත්වනු ලැබේ. මෙම විභාගය කල් දැමීමට හෝ අවලංගු කිරීමට සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

03. *සේවා කොන්දේසි* :

රජයේ සේවයේ පත්වීම් පාලනය කරන පොදු කොන්දේසිවලට ද, මෙහි පහත සඳහන් කොන්දේසිවලට ද, යටත්ව ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියට බඳවා ගනු ලැබේ.

(i) පත්කරනු ලබන නිලධාරියා දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ කොන්දේසියට යටත්වේ.

(ii) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) බඳවා ගනුලබන නිලධාරින් වසර 03 ක පරිවාස කාලයකට යටත් කරනු ලැබේ. රාජ්‍ය සේවයේ තනතුරක සේවය ස්ථිර කරන ලද නිලධාරියෙකු පත්කරනු ලැබුවහොත්, එක් වසරක වැඩ බැලීමේ කාලසීමාවකට යටත් කරනු ලැබේ. විවෘත බඳවා ගැනීම් තුළින් පත් කරනු ලබන නිලධාරින් තනතුරේ ස්ථිර කිරීමට පෙරාතුව, නියමිත පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණයෙන් සමත්ව තිබීම ද අවශ්‍ය වේ.

(iv) රාජ්‍ය සේවයට බඳවා ගනුලබන සියළුම නිලධාරින් සේවයට බැඳුනු රාජ්‍ය භාෂාවකට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳ ප්‍රවීණතාවයක් සේවයට බැඳී වසර 05 ක් තුළ ලබාගත යුතුය.

(v) පත්වීම් ලබන නිලධාරියා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගවලට ද, කාර්ය පරිපාටික රීතිවලට ද, ආයතන සංග්‍රහයේ විධි විධාන වලටද, මුදල් රෙගුලාසිවලටද, රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන නියමයන් හා රෙගුලාසිවලටත්, අමාත්‍යාංශයේ හා දෙපාර්තමේන්තුවේ රෙගුලාසිවලටත් යටත් වේ.

04. *වැටුප් පරිමාණය* :
MN-3-2006A - පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරේ III ශ්‍රේණියේ රු. 15,005- 4 x 180 - 6 x 240 - 11 x 320 - 20 x 360 - රු. 27,885 (රා. පරි. ච. ලේ. 07/2008 අනුව මාසික)

මෙම වැටුප් පරිමාණයේ රු. 15,005 - 4 x 180 - 6 x 240 - රු. 17,165 වැටුප් පියවරයන් මෙම ශ්‍රේණියට හිමිවේ.

III ශ්‍රේණියේ නිලධාරින් තුන්වන වැටුප් වර්ධකය ලැබීමට පෙර පළමුවන කාර්යක්ෂමතා කඩඉම සමත් විය යුතුය.

05. *වයස් සීමාව* :-
අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස අවු 18 ට නොඅඩු විය යුතු අතර, අවුරුදු 30 ට නොවැඩි විය යුතුය.

06. *අධ්‍යාපන සුදුසුකම් හා වෘත්තීය සුදුසුකම්* :-
රසායන විද්‍යාව, කෘෂිකර්ම විද්‍යාව, හා ජීව විද්‍යාව යන විෂයයන් අතරින් විෂයයන් දෙකක් සහිතව විද්‍යා/ගණිත විෂය ධාරාවන්ට අයත් විෂයයන් තුනකින් අ.පො.ස. (උ. පෙළ) විභාගය එකවර සමත්වීම.;

සහ

සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව, ගණිතය සහ තවත් එක් විෂයකට සම්මාන සාමාර්ථයක් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත්ව තිබීම.

*වෘත්තීය සුදුසුකම්* :

තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් අනුමත ආයතනයක් විසින් පිරිනමනු ලබන දෑ අවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමා සහතිකය ලබා තිබීම;

හෝ

සත්ත්ව පාලන ක්ෂේත්‍රයට අදාළව ජාතික වෘත්තීය කුසලතා (NVQ) 6 මට්ටමේ සුදුසුකම් සම්පූර්ණ කර තිබීම.

හෝ

උසස් අධ්‍යාපන අමාත්‍යාංශය සහ ඉහත සඳහන් තාක්ෂණ සහතික නිකුත් කරන ආයතනවලින් විමසා අදහස් ලබා ගැනීමෙන් අනතුරුව ඉහත සඳහන් තාක්ෂණික සුදුසුකම්වලට සියළු අතින් සමාන යැයි තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන වෙනත් තාක්ෂණික සුදුසුකම් ලබා තිබීම.

**සටහන** :
ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හෝ ඊට පෙර පූර්ව සුදුසුකම් ලබාගෙන තිබිය යුතුය. ප්‍රතිඵල අපේක්ෂාවෙන් ඉදිරිපත් කරන ඉල්ලුම්පත් වලංගු නොවේ.

*කායික සුදුසුකම්* :
මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් හා විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු අතර, මනා ශරීර සෞඛ්‍ය තත්ත්වය වෛද්‍ය පරීක්ෂණ වාර්තාවක් මගින් සනාථ විය යුතුය.

*වෙනත්* :-
(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය,
(ii) විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතුය,
(iii) සේවයට බඳවා ගැනීම සඳහා වන තරග විභාගයට පෙනී සිටීම සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති ලෙසට පිළිගනු ලබන්නේ, අයදුම්කරු අදාළ සියළු සුදුසුකම් හා නියමිත වයස් සීමාව අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් කරනු ලබන දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබෙන්නේ නම් පමණි.

07. *බඳවා ගැනීමේ ක්‍රමය* :

ලිඛිත තරග විභාගයක සහ සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගනු ලැබේ. ලිඛිත විභාගය සමත් අයදුම්කරුවන්ගේ මුළු ලකුණුවල කුසලතාවයේ අනුපිළිවෙල අනුව බඳවා ගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර සුදුස්සන් තෝරා ගනු ලැබේ.

*ලිඛිත විභාගය :*

මෙම විභාගය ප්‍රශ්න පත්‍ර 02 කින් සමන්විත වේ.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු පරිමාණය* | *සමත් ලකුණු පරිමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 2. පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) | පැය 01 | 100 | 40 |

08. *විභාගය :-*

(i) මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පැවැත්වේ.
(ii) අපේක්ෂකයින් කැමති භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක.
(iii) ඉල්ලීම කරන ලද භාෂා මාධ්‍ය විභාගයේදී වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
(iv) විභාග ගාස්තුව රු. 400කි.
(v) සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට නිකුත් කරන ලද පේරාදෙණිය, තැපැල් කාර්යාලයෙන් මුදල් කරගත හැකිවන සේ ලබාගත් මුදල් ඇණවුමක් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ ඇලවිය යුතුය.
(vi) විෂය නිර්දේශය :

(*අ*) බුද්ධි පරීක්ෂණය.- අපේක්ෂකයාගේ සිතීමේ තර්කානුකූලතාවයත් ඔහුගේ සිතීමේ විශ්ලේෂණ තත්වයත් තීරණය කිරීමේ ශක්තියත් විනිශ්චය කිරීම සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය.

(*ආ*) පොදු පරීක්ෂණය (තාක්ෂණ හා විෂයානුබද්ධ පරීක්ෂණය) :
(i) ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා සත්ව පාලන කටයුතු පිළිබඳ පවත්නා සම්පත්, විභවයන් වර්තමාන තත්ත්වයන් හා ආර්ථිකයට ඇති දයකත්වය
(ii) ශ්‍රී ලංකාවේ සත්ව නිෂ්පාදන රටා, නිෂ්පාදන ප්‍රමාණයන් හා අලෙවිකරණ ක්‍රම ශ්‍රී ලංකාවේ පවතින සත්වපාලන ගොවිපල රටා ඒවායේ පිහිටීම හා විසිරීම
(iii) ගොවිපල සතුන් අභිජනනය සඳහා බහුලව යොදගන්නා ක්‍රම
(vi) බෝවෙන සත්ව රෝග, සත්වරෝග මර්ධන ක්‍රියා පිලිවෙත් රෝගි සතුන්ගේ නියැදි රැස්කිරීම හා ප්‍රවාහනය
(v) ඒකාබද්ධ ගොවිපල් ක්‍රම හා ප්‍රතිචක්‍රිය කරණ ක්‍රම
(vi) සත්වපාලන හා අශ්‍රිතව කර්මාන්ත කිරි සැකසීම, මස් සැකසීම, සත්ව ආහාර නිෂ්පාදනය
(vii) සත්ව නිෂ්පාදන ක්‍රියාවලියට අදල ආදායම් වියදම් ගණනය ක්‍රම, ගොවිපල් වාර්තාකරණය හා ගිණුම් විශ්ලේෂණය, සත්ව ගොවිපල් සැලසුම්කරණය
(viii) විද්‍යාත්මක තොරතුරු ප්‍රචාරක ක්‍රම භාවිතය හා ඒවායේ ඵලදයිතාවයන්

09. *ඉල්ලුම් කිරීමේ ක්‍රමය :*

(i) ඉල්ලුම් පත්‍රය මෙම නිවේදනය සමඟ ඇති ආදර්ශ ආකෘතියට අනුකූළ විය යුතුය. 8 1/2 x 12 (A4) ප්‍රමාණයේ කඩදසියක දෙපැත්තම ප්‍රයෝජනය ගනිමින් සකස් කර ගත් ඉල්ලුම්පත්‍රය 2016 මාර්තු 28 දිනට පෙර අධ්‍යක්ෂ ජනරාල්, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 13, ගැටඹේ, පේරාදෙණිය යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත්‍ර බහාලන කවරයේ වම්පස ඉහළ කෙලවරේ ''පශු සම්පත් සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ තරඟ විභාගය'' යනුවෙන් පැහැදිලිව සටහන් කල යුතුය. මෙදිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

සටහන :

(ii) රජයේ සේවයේ නියුක්ත අයදුම්කරුවන් ස්වකීය ඉල්ලුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානීන්/ආයතන ප්‍රධානියා මඟින් ඉදිරිපත් කිරීම අතවශ්‍ය වේ.

(ii) සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේදී ඉල්ලුම්පත්‍ර නැතිවීම හෝ ප්‍රමාදවීම සම්බන්ධව කෙරෙන කිසිම පැමිණිල්ලක් භාරගනු නොලැබේ.

(iii) ඉල්ලුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. විභාගය පැවැත්වෙන දිනය පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කරනු ලැබේ. ඉල්ලුම්කරුවන්ට විභාග ප්‍රවේශ පත්‍රය විභාගය පැවැත්වෙන දිනයට දින හතරකට කලින් නොලැබුනහොත් පහත සඳහන් විස්තර ඇතිව වහාම සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ට දැන්විය යුතුය.

(i) අපේක්ෂකයාගේ සම්පූර්ණ නම :
(ii) ලිපිනය :
(iii) ඉල්ලුම්පත් තැපැල් කිරීමේ දිනය, ලියාපදිංචි අංකය, තැපැල් කාර්යාලය :

10. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුය.
(i) උප්පැන්න සහතිකය,
(ii) අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තහවුරු කිරීමේ සහතික

අපේක්ෂකයාගේ අනන්‍යතාවය :-
විභාගයට පෙනී සිටින සෑම අයදුම්කරුවෙක්ම විභාග ශාලාවේ දී තමාගේ අනන්‍යතාව විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් ඔප්පුකර සිටිය යුතුය. ඒ සඳහා පහත ලේඛණ පිළිගැනේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් නිකුත් කරන ලද හැඳුනුම් පත්‍රය,
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සාවද්‍ය තොරතුරු සැපයීම :*
මෙම විභාගයට ඉදිරිපත්වීම සඳහා යම් අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක හෝ ඔහුගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට හැකි වන්නේය. අපේක්ෂකයෙකු ඉදිරිපත් කල කිසියම් තොරතුරක් සාවද්‍ය බව දන දන ඉදිරිපත් කල බව පෙනී ගිය හොත් ඔහු සේවයෙන් පහ කිරීමට යටත් වන්නේය.

මෙම *ගැසට් පත්‍රයේ* 03 ඡේදයේ ප්‍රකාශිත රාජ්‍ය සේවයට පත් කිරීමට අදාළ වන පොදු කොන්දේසි කෙරෙහි හා විභාග අපේක්ෂකයින් සඳහා නීති හා උපදෙස් කෙරෙහි අවධානය යොමු කර ඒවා පිළිපැදිය යුතුය.

11. මෙම *ගැසට්* නිවේදනයේ, සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු වන්නේය.

12. මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් නොවන යම් කරුණක් ගැන ගැටළුවක් මතු වුවහොත් ඒ සම්බන්ධයෙන් ද විභාගය මඟින් බඳවා ගත යුතු අපේක්ෂක සංඛ්‍යාව සම්බන්ධයෙන් ද තීරණයක් ගැනීමේ බලය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් සතුවේ. එය අවසන් තීරණය වේ.

වෛද්‍ය ඩී. ආර්. ටී. ජී. රත්නායක,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් *(වැ.බ.)*

2016 පෙබරවාරි මස 10 දින,
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව,
පේරාදෙණිය.

*ග්‍රාමීය ආර්ථිකය පිළිබඳ අමාත්‍යාංශය*

*සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව*

**ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ III ශ්‍රේණියේ පශු සම්පත් සංවර්ධන නිලධාරී තනතුර සඳහා අයදුම්පත**

| විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍ය | |
|---|---|

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි)

සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාල අංකය කොටුව තුළ ලියන්න)

01. නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) :———.
(උදා. SILVA B. A.)

1.2 සම්පූර්ණ නම සිංහලෙන් :———.

1.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

02. ලිපිනය :
පෞද්ගලික :———.
රාජකාරි :———.
ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :———.

03. ස්ත්‍රී/පුරුෂ භාවය (අදල කොටුව තුළ සළකුණු කරන්න) :

3.1 ස්ත්‍රී ☐
පුරුෂ ☐

3.2 උපන් දිනය :

වර්ෂය ☐☐☐☐ මාසය ☐☐ දිනය ☐☐

3.3 ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසන් දිනට වයස :

අවුරුදු ☐☐ මාස ☐☐ දින ☐☐

3.4 විවාහක/අවිවාහක බව (අදාල කොටුව තුල සළකුණු කරන්න)

විවාහක ☐
අවිවාහක ☐

04. අධ්‍යාපන සුදුසුකම් :

4.1 අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය :

වර්ෂය :———. මාසය :———.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.2 අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගය

වර්ෂය :———. මාසය :———.

| *විෂය* | *ලබාගත් සාමාර්ථය* | *විභාග අංකය* |
|---|---|---|
| | | |

4.3 (*අ*) වෘත්තීය සුදුසුකම් ලබාගත් ආයතනය :———.

(*ආ*) වෘත්තීය සුදුසුකම් ලබාගත් වර්ෂය :———.

05. වර්තමාන රැකියාව හා කලින් දැරූ පත්වීම් (ඇත්නම් පමණක්)

| *තනතුර* | *ආයතනය* | *සිට* | *දක්වා* |
|---|---|---|---|
| | | | |

06. විභාග ගාස්තු ගෙවූ තැපැල් කාර්යාලයේ නම :———.

මුදල් ඇණවුම් අංකය :———.

| |
|---|
| සම්පූර්ණ විභාග ගාස්තුව රු. 400 කි. දිවයිනේ ඕනෑම තැපැල් කාර්යාලයකින් සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය අධ්‍යක්ෂ ජනරාල් නමට ගෙවන කාර්යාලය : පේරාදෙණිය<br>කුවිතාන්සිය මෙහි අලවන්න. |

07. මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත්, නිවැරදි වූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුලත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවටත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකිරීමට යටත්වන බවත් මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

දැනට රජයේ ස්ථිර සේවයේ නියුක්ත නිලධාරීන්ට පමණක් අදාල වේ.

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය*

මෙම දෙපාර්තමේන්තුවේ.......................... ලෙස සේවය කරන ................. මයා/මිය/මෙනවිය විසින් සපයා ඇති විස්තර පරීක්ෂා කර බැලූ බවත් ඒවා නිවැරදි බවත් අපේක්ෂකයා/අපේක්ෂිකාව ඉහත තනතුර සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කල හැකි/නොහැකි බවත් සහතික කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියා.
(නිල මුද්‍රාව තැබිය යුතුය)

පදවි නාමය :———.
ලිපිනය :———.
දිනය :———.

02-815

## රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III ශ්‍රේණියේ තනතුරුවල පවතින පුරප්පාඩු 13 ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය සඳහා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව පිළියෙල කරන ලද අයදුම්පත් පහත සඳහන් දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, තැ. පෙ. 1503, කොළඹ වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. කවරයේ වම් පස උඩ කෙළවරේ "ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)" යනුවෙන් පැහැදිලිව සටහන් කළ යුතු ය. තව ද විභාගයේ නම සිංහල ඉල්ලුම් පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ ඉල්ලුම් පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතු ය.

(අ) අයදුම්පත් කැඳවන අවසාන දිනය 2016.03.28 දින වේ.

*සටහන.*—ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ සම්බන්ධ ලිපියක් තැපෑලේ දී නැතිවූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනය දක්වා ඉල්ලුම්පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගත යුතු ය.

1. *සේවයට බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) ලිඛිත විභාගයක හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවාගනු ලැබේ.

තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

පත්කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම් ක්‍රියාත්මක වන දිනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියෝගය අනුව තීරණය කරනු ලැබේ.

2. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ii) මෙම තනතුරට පත්වීම් ලබන නිලධාරීන් වසරක වැඩ බැලීමේ කාලයකට යටත් වන අතර බඳවාගෙන වසර තුන (03) ඇතුළත පළමුවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් විය යුතු ය.

(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 01/2014 අනුව හා ඊට අනුශාංගික චක්‍රලේඛ අනුව තනතුරට බැඳී වසර 05ක් ඇතුළත නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා ගත යුතුය.

(iv) රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පරිපාටික රීතිවලට ද, සේවා ව්‍යවස්ථාවේ සඳහන් කොන්දේසිවලට ද මෙම පත්වීම යටත් වේ.

3. *වැටුප් ප්‍රමාණය* .— මෙම තනතුරට රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) දරන වැටුප් චක්‍රලේඛයට අනුව SL-1-2006 රු. 22,935- 10 x 645 - 8 x 790 - 17 x 1050 -රු. 53,555 ක (මාසික) වැටුප් පරිමාණයක් හිමි වේ.

4. *අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද* :

4.1 පළපුරුද්ද

(1) (අ) 2 වන පන්තියේ I ශ්‍රේණියේ නිලධරයෙකුවීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

(2) (අ) 2 වන පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා පූර්වාසන්න වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම;

සහ

(ආ) අංක 4.2 හි දැක්වෙන අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම

4.2 *අධ්‍යාපන සුදුසුකම්* :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය/පරිගණක ඉංජිනේරු විද්‍යාව හෝ පරිගණක තාක්ෂණයට අදාළ උපාධියක් ලබා තිබීම;

හෝ

(2) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම (මෙහිදී සම්පූර්ණ උපාධි පාඨමාලාවෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳව විය යුතු ය.);

සහ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

(3) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

5. වයස් සීමාව : අදාළ නොවේ.

6. කායික සුදුසුකම් :

(i) සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්,

(ii) තනතුරෙහි රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතු ය.

7. වෙනත් සුදුසුකම් :

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.

(ii) අයදුම්කරුවන් විශිෂ්ඨ චරිතයකින් යුක්ත විය යුතු ය.

(iii) තනතුරට බඳවාගැනීම සඳහා අවශ්‍ය සියලුම සුදුසුකම් අයදුම්පත් මෙම නිවේදනයේ සඳහන් කරනු ලබන අවසන් දිනට සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

8. ලිඛිත විභාගය :

8.1. මෙම විභාගය විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලැබේ.

| *විෂයයන්* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමණාකරණය සඳහා අභියෝග්‍යතාව | පැය 2 | 100 | 40 |

*සටහන.*— සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්න පත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක්වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිලි අත් අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන් කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.1.1 විෂය නිර්දේශය

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. සාමාන්‍ය බුද්ධිය | සංඛ්‍යාත්මක, භාෂාමය හා රූපාකාර ව්‍යුහයන් සහ අන්තර් සම්බන්ධතාවන්ට අදාළව ඉදිරිපත් කෙරෙන ගැටලු සම්බන්ධයෙන් විශ්ලේෂණ කුසලතාව, තාර්කික අවබෝධය, අර්ථකථන හැකියාව, වෙනත් තත්ත්වයන්ට අදාළ කරගැනීමේ හැකියාව හා නිගමනයන්ට එළඹීම සම්බන්ධව අපේක්ෂකයා සතු බුද්ධි මට්ටම මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතු ය.) |

| ප්‍රශ්න පත්‍රයේ නම | විෂය නිර්දේශය |
|---|---|
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කළමනාකරණය සඳහා අභියෝග්‍යතාව | රාජ්‍ය සේවයේ විවිධ පරිසරයන්හි තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රය අදළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්‍ෂකයාට යොමු කර අපේක්‍ෂකයා සතු තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ දැනුම, නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට අදළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්‍ෂා කෙරේ. (මෙම ප්‍රශ්න පත්‍රය කෙටි ප්‍රශ්න හා ව්‍යුහගත ප්‍රශ්නවලින් සමන්විතය. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.) |

8.2 *සම්මුඛ පරීක්ෂණය*

8.2.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය : (ලකුණු ලබාදෙනු නොලැබේ.)

ඉටු කර ගැනීමට අපේක්ෂිත අරමුණු :

සේවා ව්‍යවස්ථාවට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම.

9. *විභාග කොන්දේසි* :

I. විභාගය සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි භාෂා මාධ්‍යවලින් පවත්වනු ලැබේ. අපේක්ෂකයන් කැමැති එක් භාෂාවකින් විභාගයට පෙනී සිටිය හැක. අපේක්ෂකයන් මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු දිය යුතු ය. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පත්‍රයෙහි දක්වෙන විභාග මාධ්‍ය වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ. සෑම අපේක්ෂකයෙකුම ප්‍රශ්න පත්‍ර දෙකටම පෙනී සිටිය යුතු ය.

II. විභාග ගාස්තු රු.1,000 කි. විභාග ගාස්තුව විභාග කොමසාරිස් ජනරාල්ගේ ආදයම් ශීර්ෂ 2003-02-13 ට බැර වෙන ලෙස දිවයිනේ පිහිටි ඕනෑම තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවා අයදුම්කරුගේ නමින්ම ලබා ගන්නා ලදුපතෙහි දරයක් මගින් ඉල්ලුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවන්න. එම කුවිතාන්සියේ ඡායා පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

III. විභාගය සඳහා ගෙවන ලද මුදල කිසිම හේතුවක් නිසා ආපසු ගෙවනු නොලැබේ.

IV. මෙම විභාගය 2016 ජුනි මස කොළඹ දී පැවැත්වේ. විභාගය පවත්වනු ලබන දිනය පසුව දැනුම් දෙනු ලැබේ.

V අසම්පූර්ණ අයදුම්පත් දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

*සටහන.*— ප්‍රවේශ පත්‍රය නොමැතිව විභාග ශාලාවට ඇතුලු වීමට ඉඩ දෙනු නොලැබේ. විභාගය ආරම්භ වන දිනයේ විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වන්නේ තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රයක් පමණි.

අපේක්ෂකයෙකු විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් කිරීමට සුදුසුකමක් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැළකිය යුතු ය.

VI ඉල්ලුම් පත්‍රය සෙ. මී. 21-29 ප්‍රමාණයේ A4 කඩදසිවල සකස් කළ යුතු අතර, 1.0 සිට 1.6 තෙක් ශීර්ෂ පළමු වන පිටුවට ද, අංක 1.7 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුවලට ද ඇතුළත් වන සේ අයදුම් පත්‍රය සකස් කළ යුතු ය. ඊට අදළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතු ය. ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍ර අසම්පූර්ණ ඉල්ලුම්පත්‍ර සහ දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම් පත්‍රයේ පිටපතක් ලඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. තව ද සම්පූර්ණ කරනු ලබන ඉල්ලුම් පත්‍රය විභාග නිවේදනයේ සඳහන් ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසා බැලිය යුතු බවත්, එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප වන බවත් වැඩි දුරටත් දන්වමි.

VII ඉල්ලුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලබන අතර, විභාගය සඳහා අයදුම්කරුවන්ට ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම පුවත්පත්වල නිවේදනයක් පල කරනු ලැබේ. නිවේදනයේ පලවී දින 2 හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටි ය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ද ලියාපදිංචි කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත ෆැක්ස් මගින් යොමු කිරීම වඩාත් ඵලදයී වනු ඇත.

VIII රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත විභාගය කල් දැමීම හෝ අවලංගු කිරීමේ බලය විභාග කොමසාරිස් ජනරාල්වරයා සතු වේ.

IX විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදු වනු ඇත.

X *අපේක්ෂකයාගේ අනන්‍යතාවය.*—විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් සෑම අපේක්ෂකයෙකුම විභාග ශාලාවේ දී තම අනන්‍යතාවය ඔප්පු කර සිටිය යුතු ය. ඒ සඳහා පහත සඳහන් ලේඛනවලින් එකක් පමණක් පිළිගනු ලැබේ.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කළ ජාතික හැඳුනුම්පත;
(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය.

*සැළකිය යුතුය* :

(*අ*) අයදුම්පතට කිසිදු ලියවිල්ලක් හෝ එහි පිටපතක් නොඇමිණිය යුතු ය.

(*ආ*) ඉල්ලූ අවස්ථාවක දී ලියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත්වන අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ගැන සළකා බලනු නොලැබේ.

(*ඇ*) අයදුම්පත්‍රය තම දෙපාර්තමේන්තු ප්‍රධානියා මඟින් ඉදිරිපත් කළ යුතු ය.

XI විභාග කොමසාරිස් ජනරාල් විසින් පිරවීමට අපේක්ෂිත පුරප්පාඩු සංඛ්‍යාවට සමාන අපේක්ෂකයින් සංඛ්‍යාවක් ඇතුළත්වන සේ විභාගය සමත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ද ඇතිව රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම් වෙත ලබා දෙනු ඇත.

*ප්‍රතිඵල නිකුත් කිරීම.*—ලිඛිත පරීක්ෂණයෙන් එක් එක් විෂයෙන් ලකුණු 40% කට නොඅඩුව ලැබූ හා විභාගයේ මුළු ලකුණු සංඛ්‍යාවෙන් 50% ක් හෝ ඊට වැඩියෙන් ලැබූ අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත ලබා දෙනු ඇත.

විභාගයට පෙනී සිටි සියලුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව දන්වා යැවීම හෝ www.results.exams. gov.lk. වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීම විභාග කොමසාරිස් ජනරාල් විසින් සිදු කරනු ඇත.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ජේ. දඩල්ලගේ,
ලේකම්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ I වන පන්තියේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)
Limited Competitive Examination for Recruitment to Class I-III of Sri Lanka Information and Communication Technology Service - 2015 (2016)
(දෙන ලද කොටු තුළ නිවැරදි සංකේතය/අංකය පැහැදිලිව සටහන් කරන්න.)

[ ]
කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය
සිංහල - 2
දෙමළ - 3 [ ]
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

---

1.0 1.1 මුලකුරු අගට යොද මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

*උදා* : GUNAWARDHANA M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

1.3 සම්පූර්ණ නම :————.
(සිංහලෙන්/දෙමළෙන්)

1.4 කාර්යාලයීය ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) (ප්‍රවේශපත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ.) :————.

1.5 කාර්යාලයීය ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.6 පෞද්ගලික ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

1.7 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.8 ජාතික හැඳුනුම්පත් අංකය :

1.9 විවාහක/අවිවාහක බව : අවිවාහක - 1
විවාහක - 2 (අදාළ අංකය කොටුව තුළ ලියන්න)

1.10 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, මුස්ලිම් - 3, වෙනත් - 5)
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.11 උපන් දිනය : වර්ෂය මාසය දිනය

1.12 දුරකථන අංකය :

2.0 ඔබ ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයට ඇතුළත් වීම සඳහා සුදුසුකම් ලැබීමේ විභාගය/සම්මුඛ පරීක්ෂණය සමත් වූ භාෂාව සඳහන් කරන්න. :————.

3.0 (i) *ගැසට්* නිවේදනයේ 4 වන ඡේදයේ සඳහන් සියලු සුදුසුකම් සපුරා තිබේ ද? :————.

(ii) අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස :————.

(iii) අධ්‍යාපන සුදුසුකම් සහ පළපුරුද්ද :
*ගැසට්* නිවේදනයේ 04 ඡේදය අනුව සුදුසුකම් ලබන්නේ 4.1(1) සහ 4.1(2) යන ඒවායින් කුමකින් ද යන්න. :————.

(අ) 2 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු නම්,

උපාධිය NVQ/7 ප්‍රවීණතාවය වලංගු දිනය :————.
විශ්වවිද්‍යාලය/ආයතනය :————.
ලියාපදිංචි අංකය :————.
බාහිර/අභ්‍යන්තර :————.
උපාධිය/ප්‍රවීණතාවය :————.
විෂයයන් :————.
භාෂා මාධ්‍යය :————.

(ආ) නිවේදනයේ 4.2 (2)අනුව සුදුසුකම් ලබන්නේ නම්,
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව පිළිබඳ තොරතුරු :————.
පශ්චාත් උපාධි ඩිප්ලෝමාව :————.
වලංගු දිනය :————.

(iv) දැනට දරන තනතුර :————.

එම තනතුර අයත් වන්නේ ඒකාබද්ධ සේවයට ද යන්න :————.

| *පන්තිය* | *ශ්‍රේණිය* | *පත්වූ/උසස් වූ/අන්තර්ග්‍රහණය වූ දිනය* |
|---|---|---|
| 3 | III | |
| 3 | II | |
| 3 | I | |
| 2 | II | |
| 2 | I | |

(v) *ගැසට් නිවේදනයේ* 4 වැනි ඡේදයේ සඳහන් කොන්දේසි ප්‍රකාරව ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවාවේ අනුමත තනතුරක සුදුසුකම් සම්පූර්ණ කළ යුතු දිනට අදළ පරිදි වසර 05ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලය සම්පූර්ණ ද යන්න :————.

4.0 මුදල් කුවිතාන්සිය (ලදුපත) මනා ලෙස අලවන්න :

| ලදුපත (මුල්පිටපත) නොගැලවෙන ලෙස එහි දරයක් මෙහි අලවන්න.<br>(ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබාගන්න.) |
|---|

5.0 *අයදුම්කරුගේ සහතිකය* :

2016.03.28 වැනි දිනට පූර්වාසන්නයේ වූ පස් අවුරුද්ද තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්‍ෂණ සමත්වීම කොන්දේසියක් වන වේතනාධිකය හැර) වේතනාධික සියල්ල මා විසින් උපයාගෙන ඇති බවත්, *ගැසට් නිවේදනයේ* 4.1 ඡේදයට අනුව 2016.03.28 වැනි දිනට සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහිත බවත්, (අවවාද කිරීම් හැර) මොනම ආකාරයක හෝ විනයානුකූල දඬුවමකට මා භාජනය වී නොමැති බවත් ප්‍රකාශ කරමි. තව ද විභාග කොමසාරිස් ජනරාල් විසින්, විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බව ද ප්‍රකාශ කරමි.

*ගැසට් නිවේදනයේ* සඳහන් සියලුම නීති රෙගුලාසි ප්‍රකාරව සීමිත තරග විභාගයට පෙනී සිටීමට මා සුදුස්සකු බවත්, මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ......... හා ......... වැනි දින දරන මුදල් කුවිතාන්සිය මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්‍ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත්වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය : (අයදුම්කරුගේ පෞද්ගලික ලිපි ගොනුවට අනුව)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන .................... මයා/මිය/මෙනවිය ඒකාබද්ධ සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2 - ii හා 2 - i ශ්‍රේණියේ තනතුරක සේවය කරන බව ද, අයදුම්පත් කැඳවන අවසන් දිනට පූර්වයෙන් වූ පස් අවුරුදු කාල සීමාව තුළ (සේවා හෝ දෙපාර්තමේන්තුමය පරීක්‍ෂණ සමත්වීමේ කොන්දේසියක් වන වේතනාධික හැර) ඔහුගේ/ඇයගේ වේතනාධික සියල්ල උපයාගෙන ඇති බව ද, එම කාල සීමාව තුළ කළ වරදකට (අවවාද කිරීම් හැර) කිසිම ආකාරයක විනයානුකූල දඬුවමකට ඔහු/ඇය භාජනය නොවූ බව ද, *ගැසට් නිවේදනයේ* 4.1 ඡේදයට අනුව අවුරුදු පහක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සහිත බව ද, අදළ *ගැසට් නිවේදනයෙහි* සඳහන් රෙගුලාසි ප්‍රකාරව ඔහු/ඇය විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ලබා ඇති බව ද, නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බව ද, එම ලදුපත අලවා ඇති බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී මෙම අයදුම්පත්‍රය අත්සන් කළ බව ද, මෙයින් සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ/බලයලත්
නිලධාරියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.

(නිල මුද්‍රාව යොදන්න.)

02-840

---

## ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණිය සඳහා බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)

1.0 ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරුවලට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම තරග විභාගය 2016 ජූනි මස විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී පවත්වනු ඇත.

2.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ලිඛිත පරීක්‍ෂණයක ප්‍රතිඵල අනුව කුසලතාවය මත සුදුසුකම් සපුරා ඇති අපේක්‍ෂකයන් ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියේ තනතුරු සඳහා පත් කිරීමට තෝරා ගනු ඇත. මෙම විභාගය කොළඹ දී පමණක් පවත්වනු ලැබේ.

3.0 මෙහිදී පිරවීමට අපේක්‍ෂිත මුළු පුරප්පාඩු සංඛ්‍යාව 62කි. පත්වීම ක්‍රියාත්මක වන දිනය පත්වීම් බලධරයා විසින් නිශ්චය කරනු ලැබේ. කිසියම් ඇබෑර්තු සංඛ්‍යාවක් හෝ ඇබෑර්තු සියල්ලම හෝ නොපිරවීමට හෝ පත්වීම් බලධරයාට බලය ඇත.

4.0 *වැටුප* :-ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1894/26 හා 2014.12.26 වැනි දින *ගැසට්* පත්‍රයේ සහ අංක 06/2006 (iv) හා 2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව, ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2-ii, හා 2-i වන ශ්‍රේණිවලට අදළ මාසික වැටුප් පරිමාණය රු. 17,680-10x320-11x365-15x450-රු.31,645 (MN-6-2006-A) වේ. රු. 21,245 න් ඔබ්බට යෑම සඳහා 2 වන පන්තියේ i වන ශ්‍රේණියට උසස්වීම ලබාගත යුතු ය.

5.0 මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිතය.

6.0 *සුදුසුකම්.*—ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 2 වන පන්තියේ ii ශ්‍රේණියේ තනතුරට උසස් කිරීම සඳහා පහත සුදුසුකම් සපුරා තිබීම අදළ වේ.

(*අ*) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.

(*ආ*) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.

(*ඇ*) කායික සුදුසුකම් : සෑම අපේක්‍ෂකයෙකුම ශ්‍රී ලංකාව තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමට ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුයි.

(*ඈ*) *පළපුරුද්ද* :

(*අ*) (i) ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්‍ෂණ සේවයේ 3 පන්තියේ I ශ්‍රේණියේ වසර 04ක සේවා කාලයක් සමඟ පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් සපුරා තිබීම;

හෝ

(*ආ*) (i) මෙම නිවේදනයේ 6.1 හි සඳහන් අධ්‍යාපන සුදුසුකම් සපුරා තිබීම සහ

(ii) 3 පන්තියේ II ශ්‍රේණියේ නිලධරයෙකු වීම හා පූර්වාසන්න වසර 05ක සක්‍රීය හා සතුටුදයක සේවා කාලයක් තිබීම.

(*ඇ*) ඉහත සුදුසුකම්වලට අමතරව අයදුම්පත් කැඳවන අවසාන දිනට සේවයේ ස්ථිර කර තිබිය යුතු ය.

6.1 *අධ්‍යාපන සුදුසුකම්* :

(1) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

හෝ

(2) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්‍ෂණය ප්‍රධාන විෂයක් සහිත උපාධියක් ලබා තිබීම. (මෙහිදී සම්පූර්ණ උපාධියෙන් අවම වශයෙන් 1/3 කොටසක් පරිගණක විද්‍යාව/තොරතුරු තාක්‍ෂණය පිළිබඳව විය යුතුය.);

සහ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/ තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම;

හෝ

(3) (i) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ උපාධියක් ලබා තිබීම;

සහ

(ii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රදනය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ආයතනයකින් හෝ පරිගණක විද්‍යාව/තොරතුරු තාක්‍ෂණය පිළිබඳ පශ්චාත් උපාධියක් ලබා තිබීම;

හෝ

(4) (i) තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තොරතුරු තාක්‍ෂණය පිළිබඳ අවම වශයෙන් ජාතික වෘත්තීය කුසලතා (NVQ) හත (07) මට්ටමේ ප්‍රවීණතාවයක් ලබා තිබීම.

*සටහන* : (i) සෑම අයදුම්කරුවකුම තනතුරට අදළ සියලු සුදුසුකම් අයදුම්පත් කැඳවන අවසාන දිනට හෝ ඊට පෙර හෝ සම්පූර්ණ කර තිබීම අනිවාර්‍යය වේ.

7.0 *විභාග පරිපාටිය සහ විෂය නිර්දේශය* :

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. මෙම විභාගය සිංහල, දෙමළ, ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. අභියෝග්‍යතාව | පැය 1 | 100 | 40 |
| 2. තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සිද්ධි අධ්‍යයනය | පැය 2 | 100 | 40 |

1. *අභියෝග්‍යතාව* :
විභාග අපේක්‍ෂකයාගේ සංඛ්‍යා ලේඛනාත්මක හැකියාව, තර්කානුකුල කරුණු දක්වීම පිළිබඳ දනුම පරීක්‍ෂා කිරීමේ ප්‍රශ්න මෙම ප්‍රශ්න පත්‍රයට අඩංගු වේ. බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විත වන අතර ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

2. *තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ සිද්ධි අධ්‍යයනය :*
රාජ්‍ය සේවයේ තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ ක්ෂේත්‍රයට අදළව ඇතිවිය හැකි ගැටලු එකක් හෝ කිහිපයක් සම්බන්ධ කරමින් ගොඩනගන ලද සිද්ධියක්/සිද්ධීන් අපේක්‍ෂකයාට යොමු කර අපේක්‍ෂකයා සතු නිර්මාණාත්මක චින්තන ශක්තිය හා ගැටලු නිරාකරණය කිරීමේ හැකියාව ආයතන සංග්‍රහය, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති හා මුදල් රෙගුලාසිවලට

අදාළව රාජ්‍ය සේවයේ පරිචය ආශ්‍රයෙන් මැන බැලීම මෙයින් අපේක්ෂා කෙරේ. ව්‍යුහගත මාදිලියේ ප්‍රශ්න සහ රචනා ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය.

*සටහන.—* සේවයේ රාජකාරි සඳහා අපේක්ෂකයෙකුගේ යෝග්‍යතාව සහ හැකියාව පරීක්ෂා කර බැලීමට මෙම ප්‍රශ්නපත්‍ර සකස් වී ඇත. මෙම විභාගය තරග විභාගයක් වුව ද එක් එක් විෂය සඳහා වෙන් කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් 40% වත් අපේක්ෂකයා විසින් ලබා ගත යුතු අතර විභාගයේ මුළු ලකුණු ගණනින් යටත් පිරිසෙයින් 50% ක් වත් ලබා ගත යුතු වේ. සෑම ලිඛිත පිළිතුරු පත්‍රයක් සම්බන්ධයෙන් අපැහැදිලි අත්අකුරු හා වචනවල අක්ෂර වින්‍යාසය පිළිබඳ වැරදි සම්බන්ධයෙන් ලකුණු අඩු කරනු ලැබේ. තරග විභාගය සඳහා වෙන්කොට ඇති පුරප්පාඩු ගණන සපුරාලන පරිදි ලබාගත් ලකුණු අනුපිළිවෙල තරයේම අනුගමනය කරමින් පත්වීම් කරනු ලැබේ.

8.0 *ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :*

අයදුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැළකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අපේක්ෂකයකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙන අතරතුර දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවකු විසින් ඉදිරිපත්කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගියහොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන.

9.0 විභාග ගාස්තු :

විභාග ගාස්තුව රු. 500 කි. මෙම මුදල අයදුම්පත් භාරගන්නා අවසාන දින හෝ එදිනට පෙර විභාග කොමසාරිස් ජනරාල්ගේ 2003-02-13 ආදයම් ශීර්ෂයට බැරවන පරිදි ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයක් වෙත මුදලින් ගෙවිය යුතුය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයදුම්පතේ අදළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට් පතේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබාගත යුතු ය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් සහ මුද්දර භාරගනු නොලැබේ.

10.0 *අයදුම්පත්‍ර .-* ඒ4 (සෙ. මී. 21 x 29) (සාමාන්‍ය භාග්ෂීට්) ප්‍රමාණයේ කඩදසි භාවිත කරමින්,

(*අ*) අංක 01 සිට 03 තෙක් ඡේද පළමු පිටුවට ද,

(*ආ*) අංක 04 සිට ඉදිරියට වන ඡේද අනෙක් පිටුව ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍රය පිළියෙල කරගත යුතු ය.

(*ඇ*) අයදුම්පත්‍රය පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද සඳහන් කළ යුතුය.

නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත් කිසිම දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇති අතර, සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය විභාග නිවේදනයේ දක්වෙන අයදුම්පතට අනුකූලව ද යන්න අයදුම්කරු විසින් විමසා බැලිය යුතු වේ. එසේ නොවුනහොත් අයදුම්පත ප්‍රතික්ෂේප විය හැකිය.

11.0 *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර අයදුම්පත්‍ර යොමුකර ඇති සියලු අයදුම්කරුවන්ට තරග විභාගයට පෙනී සිටීමට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. තරග විභාග යට පෙනී සිටීම සඳහා ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම අයදුම්කරු මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා *ගැසට්* නිවේදනය අනුව සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේ අවශ්‍ය සුදුසුකම් නැති බව අනාවරණය වුවහොත් එම විභාග අපේක්ෂකත්වය අවලංගු කරනු ලැබේ.

12.0 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වමත් පස ඉහළ කෙළවරේ ''ශ්‍රී ලංකා තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)'' යන්න ද සඳහන් කරන්න.''

13.0 විභාගය ඉල්ලුම්කරන අවස්ථාව වන විට පැවති අයදුම්කරුවන්ගේ තනතුර සහ සේවා ස්ථානය, විභාගය සම්බන්ධ සියලු කටයුතු සඳහා අදළ වන අතර, අයදුම්පත් එවීමෙන් පසුව ඒ සම්බන්ධව සිදුවන වෙනස්වීම් කිසිවක් පිළිබඳව සලකනු නොලැබේ.

14.0 සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2016 මාර්තු මස 28 වැනි දින හෝ ඊට පෙර හෝ පහත දක්වෙන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්,
සංවිධාන සහ විදේශ විභාග ශාඛාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1503
කොළඹ.

15.0 *විභාගයට පෙනී සිටීම.—*අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කරු තමා ඉල්ලුම්කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය හා නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවෙකු නම්, එම විස්තර සමග, ෆැක්ස් මඟින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබාගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් ඵලදයී වනු ඇත. එසේ විමසීමේ දී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කළ කුවිතාන්සිය සුදනමින් තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

16.0 අපේක්ෂකයින්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියකියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත

(ii) වලංගු විදේශ ගමන් බලපත්‍රය

17.0 විභාග කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කරන ලද ප්‍රවේශපත්‍ර ඇති නිලධාරින්ට විභාගයට පෙනී සිටීමට හැකිවන පරිදි දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් රාජකාරි නිවාඩු ලබාදිය යුතුය. ගමන් ගාස්තු ගෙවනු නොලැබේ.

18.0 අපේක්ෂකයකු හට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය හෝ විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් සේ නොසැළකිය යුතුය. විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීති වලට විභාග අපේක්ෂකයන් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

19.0 මෙහි සඳහන් නොවන යම්කිසි කරුණක් වෙතොත් ඒ සම්බන්ධව ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තීරණය කරනු ඇත. සියලුම අයදුම්කරුවන් මෙම *ගැසට් නිවේදනයේ* සඳහන් පොදු විභාග නීති රීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත.

20.0 මෙහි සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය නිවේදන අතර කිසියම් අනනුකූලතාවයක් පවතී නම්, එවැනි විටෙක සිංහල මාධ්‍ය නිවේදනය අනුව කටයුතු කළ යුතුය.

කේ. වී. පී. එම්. ජේ. ගමගේ,
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්,
රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ
අමාත්‍යාංශය.

2016 පෙබරවාරි මස 12 වැනි දින,
රාජ්‍ය පරිපාලන, හා කළමනාකරණ අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.

ආදර්ශ අයදුම්පත්‍රය

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවයේ 2 වන පන්තියේ II ශ්‍රේණියට බඳවා ගැනීමේ සීමිත තරග විභාගය - 2015 (2016)
Limited Competitive Examination for Recruitment to Class 2-II of Sri Lanka Information and Communication Technology Service - 2015 (2016)

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)

---

1.0 1.1 අයදුම්කරුගේ මුලකුරු අගට යොද මුලකුරු සමග නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

උදා : GUNAWARDHANA M. G. B. S. K.

1.2 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

1.3 සම්පූර්ණ නම :—————.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 සේවා ස්ථානය හා ලිපිනය :

2.1 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

2.2 කාර්යාලයේ/දෙපාර්තමේන්තුවේ/ආයතනයේ නම හා ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :—————.

2.3 විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය :—————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :—————.

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : පුරුෂ - 0
ස්ත්‍රී - 1
(අදල අංකය කොටුව තුළ ලියන්න.)

3.2 උපන් දිනය : වර්ෂය | | | | | මාසය | | | දිනය | | |

3.3 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | |

3.4 දුරකථන අංකය : | | | | | | | | | | |

4.0 සේවා විස්තරය :

4.1 ඔබ දැනට සේවය කරන ආයතනයේ නම :————.
4.2 එය අයත්වන අමාත්‍යාංශය හෝ දෙපාර්තමේන්තුව :————.
4.3 දැනට දරන තනතුරේ පදවි නාමය :————.
4.4 දැනට දරන තනතුරට පත්වූ දිනය :————.
4.5 දැනට දරන තනතුර ස්ථිර ද නැතහොත් තාවකාලික ද යන වග :————.
4.6 දැනට දරන තනතුරෙහි සේවය ස්ථිර කර තිබේ ද යන වග :————.
4.7 දැනට දරන තනතුරේ සේවය ස්ථිර කරමින් නිකුත් කරන ලද ලිපියේ යොමු අංකය හා දිනය :————.
4.8 (අ) දැනට ලබන වැටුප :————.
(ආ) වැටුප් පරිමානය (2007.08.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 06/2006 (iv) අනුව වැටුප් කේත) :————.
4.9 ඒකාබද්ධ සේවයට අන්තර්ග්‍රහනය කළ නිලධාරියකු නම් අන්තර්ග්‍රහනය කළ දිනය :————.
4.10 3 පන්තියේ I ශ්‍රේණියේ නිලධාරියකු නම් ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනට සේවා කාලය :————.
4.11 දැනට දරන පත්වීම විශ්‍රාම වැටුප් සහිත ද යන වග :————.
4.12 අයදුම්පත් කැඳවන අවසාන දිනට දැනට දරන තනතුරේ සේවා කාලය :————.
4.13 අන්තර්ග්‍රහනය කර ඇති නිලධාරියෙකු නම් අන්තර්ග්‍රහනය කළ දිනය :————.

5.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ තැපැල්/උපතැපැල් කාර්යාලය :————.

(ii) ලදුපත් අංකය හා දිනය :————.

(iii) ගෙවූ මුදල :————.

| ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න.<br>(ලදුපතේ පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැකිය) |
|---|

මා විසින් මෙහි සඳහන් කර ඇති තොරතුරු නිරවද්‍ය බව සහතික කරමි. මෙහි සඳහන් කවර හෝ තොරතුරක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සකු කිරීමටත්, පත් කර ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමටත් හැකි බව මම දනිමි. තවද, විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් ගනු ලබන තීරණවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ / අයදුම්කාරියගේ අත්සන.
(දෙපාර්තමේන්තු ප්‍රධානියා ඉදිරිපිටදී අත්සන යෙදිය යුතුය)

දිනය :————.

*සටහන* .— තමාගේ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ එම දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙනුවෙන් අත්සන් කිරීමට බලයලත් නිලධාරියකු ඉදිරිපිට දී අයදුම්කරු විසින් අත්සන් කළ යුතුය.

*අත්සන සහතික කිරීම*

මාගේ කාර්යාලයේ නිලධරයකු/නිලධාරිණියක සහ මා පෞද්ගලික වශයෙන් දන්නා හඳුනන ......................... මහතා/මහත්මිය/මෙනවිය ................. වැනි දින මා ඉදිරිපිට දී අත්සන් කළ බව සහතික කරමි.

————,
සහතික කරන්නාගේ අත්සන සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය

1. මෙම අයදුම්කරු/අයදුම්කාරිය වන ..................................
මහතා/මහත්මිය/මෙනවිය මෙම දෙපාර්තමේන්තුවේ සේවයේ නියුක්ත අයකු බවද,
2. ඔහු/ඇය රාජ්‍ය සේවයට අයත් ඒකාබද්ධ සේවයේ ස්ථිර තනතුරක් දරමින් සිටින බවද,
3. ඔහු/ඇය ස්ථිර තනතුරක 2016.03.28 වන දින වන විට සේවයේ ස්ථිර කරනු ලැබ සිටින බව ද,
4. ස්ථිර තනතුරක සේවයේ ස්ථිර කරමින් ලිපියක් ඔහුට/ඇයට නිකුත් කර ඇති බවද,
5. ඔහු/ඇය 2016.03.28 වැනි දිනට හෝ ඊට පෙර යටත් පිරිසෙයින් අවුරුදු 05ක සක්‍රීය සේවය සම්පූර්ණ කර ඇති බවද,
(නිවේදනයේ 6(ඇ) මගින් අපේක්ෂිත පරිදි)
6. 2016.03.28 දිනට යටත් පිරිසෙන් අවුරුදු 05ක සතුටුදායක සේවා කාලයක් සපුරා ඇති බවද, (නිවේදනයේ 6(ඈ) මගින් අපේක්ෂිත පරිදි)
7. පූර්වාසන්න වසර 05 තුළ වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති බව ද,
8. මෙම විභාගය සඳහා ඉල්ලුම් කිරීමට අදළ තනතුරේ නියමිත පන්තියේ හා ශ්‍රේණියේ රැඳීසිටින බව ද,
9. මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය දැනට දරන තනතුරෙන් නිදහස් කරනු ලබන බව ද,
10. විභාග ගාස්තු වශයෙන් රු. 500 ක් ගෙවා ලදුපතක් අයදුම්පත්‍රයේ අලවා ඇති බව ද,
11. ඔහුගේ/ඇයගේ අයදුම්පතෙහි දැක්වෙන විස්තර මෙම දෙපාර්තමේන්තුවේ ඇති ලේඛන සමග හරි වැරදි බලා ඇති බව සහ මෙම විභාගයට අදළ විභාග නිවේදනයේ දැක්වෙන රෙගුලාසි අනුව මෙම විභාගයට පෙනී සිටීමට ඔහු/ඇය සුදුසු බවද, මම සහතික කරමි.

————,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන
සහ නිල මුද්‍රාව.

නම :————.
පදවි නාමය :————.
ලිපිනය :————.
දිනය :————.

**සංලක්‍ෂය :**

(1) දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් අත්සන් කිරීමට නිසි ආකාර බලතල පවරනු ලැබූ මාණ්ඩලික නිලධාරියකු හෝ විසින් පමණක් මෙම සහතිකය අත්සන් කල යුතුය. සහතිකයේ අඩංගු කරුණු සෑම අයුරකින්ම නිවැරදි බවට සහතිකය නිකුත් කරන නිලධාරියා සෑහීමකට පත්විය යුතුය.

(2) යෝග්‍යතාවය පිළිබඳව සියළුම අවශ්‍යතාවක් සම්පූර්ණ නොකරන අයදුම්කරුවන් වෙතොත් ඔවුන්ගේ අයදුම්පත් විභාග කොමසාරිස් ජනරාල් වෙත ඉදිරිපත් නොකළ යුතුය.

02-839

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.